## 2020-02-27 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹි තීරණ

01. **උතුරු හා උතුරු මැද පළාත්වල වෙසෙන ණයගැතිභාවයෙන් පෙළෙන ජනතාව සඳහා ක්ෂුද්‍ර මූල්‍ය ණය පහසුකම් සැපයීමේ වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම**

විවිධ ක්ෂුද්‍ර මූල්‍ය ආයතන වෙතින් ලබාගෙන ඇති ණය මුදල් හේතුවෙන් ණයගැතිභාවයට පත්ව සිටින ග්‍රාමීය අඩු ආදායම්ලාභීන් එම ණය උගුලෙන් ගලවා ගැනීම සඳහා සමූපකාර ග්‍රාමීය බැංකු සහ සකසුරුවම් හා ණය ගනුදෙනු සමූපකාර සමිති මාර්ගයෙන් ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කරනු ලැබ ඇත. එම ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා මේ වන විට රුපියල් මිලියන 542ක් මහා භාණ්ඩාගාරයෙන් නිදහස් කර ඇති අතර දැනට එම ණය යෝජනා ක්‍රමය චක්‍රීය අරමුදලක් ලෙස ක්‍රියාත්මක කරමින් පවතී.

මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණු ඉටු කර ගැනීම සඳහා තවදුරටත් එකී චක්‍රීය අරමුදල් මඟින් අදාළ ණය වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමටත්, ඒ යටතේ දැනට ලබා දෙන උපරිම ණය සීමාව එක් පුද්ගලයකු සඳහා රුපියල් 60,000/- දක්වා වැඩි කිරීමටත් මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු අග්‍රාමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

02. **විදේශගතව සේවය කරන ශ්‍රී ලාංකිකයින් සඳහා සමාජ ආරක්ෂණ අරමුදලක් පිහිටුවීම**

ශ්‍රී ලාංකිකයන් මිලියනයකට වැඩි ප්‍රමාණයක් විදේශ රටවල රැකියාවල නිරත වී සිටින අතර, වර්තමානයේ රටට විදේශ විනිමය ලැබෙන ප්‍රධාන ප්‍රභවය එම විදෙස්ගත ශ්‍රමිකයින් බවට පත්වී ඇත. එසේ වුවද, විදේශ ශ්‍රමිකයන් සහ ඔවුන්ගේ යැපෙන්නන්ගේ සමාජ ආරක්ෂණය වෙනුවෙන් යම් මුදලක් ඉතිරි කිරීමට නොපෙළඹෙන බවත් ඒ හේතුවෙන් ඔවුන් හට විශ්‍රාම වයසට එළඹී පසු ආර්ථික දුෂ්කරතාවන්ට මුහුණ දීමට සිදුවන බවත් නිරීක්ෂණය වී ඇත. මෙයට පිළියමක් ලෙස 'සෞභාග්‍යයේ දැක්ම' ජාතික ප්‍රතිපත්තිය මඟින් විදෙස්ගත ශ්‍රමිකයින් සඳහා දායක විශ්‍රාම වැටුපක් ආරම්භ කිරීමට යෝජනා කර ඇත. ඒ අනුව විදෙස්ගත ශ්‍රමිකයින් සඳහා දායක සමාජ ආරක්ෂණ අරමුදලක් ඇති කිරීම පිණිස පනත් කෙටුම්පත සකස් කිරීම සඳහා අවශ්‍ය මූලික කෙටුම්පත පිළියෙල කිරීමට විශේෂඥ කමිටුවක් පත් කිරීම පිණිස නිපුණතා සංවර්ධන, රැකිරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

03. **මහ මුහුදේ ධීවර කටයුතුවල යෙදෙන යාත්‍රා නිරීක්ෂණය සහ අධීක්ෂණය කිරීම පිණිස International Maritime Satellite Service (INMARSAT) සේවය ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය මඟින් සපයනු ලබන INMARSAT සේවය (Point of Service Activation - PSA) ලබා ගැනීම**

ඉන්දියානු සාගර ටූනා කොමිසමේ රෙගුලාසි අනුව ජාත්‍යන්තර මුහුදේ රැකියාව කරන සියලුම බහුදින ධීවර යාත්‍රා සඳහා චන්ද්‍රිකා තාක්ෂණයෙන් ක්‍රියාත්මක වන යාත්‍රා නිරීක්ෂණ පද්ධතියක් සවි කිරීම අනිවාර්ය කර ඇත. තවද යුරෝපා සංගමයේ රෙගුලාසි අනුව ද යුරෝපා සංගමයට මසුන් අපනයනය කරන රටවල්, යාත්‍රා සුපරීක්ෂණ පද්ධති ස්ථාපිත කර තිබිය යුතුවේ. ඒ අනුව, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි වී ඇති ජාත්‍යන්තර මුහුදේ රැකියාවේ නියුතු බහු දින ධීවර යාත්‍රා 1,500ක් සඳහා ට්‍රාන්ස්පොන්ඩර් 1,500ක් රජයේ මැදිහත්වීම මත සපයා දී ඇත. එකී ට්‍රාන්ස්පොන්ඩර් සඳහා චන්ද්‍රිකා සේවාවන් සැපයීමට අදාළ කොන්ත්‍රාත්තුව මේ වන විට අවසන් වී ඇති අතර එම සේවාව තවදුරටත් ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය හරහා ලබා දීම පිණිස අවශ්‍ය ප්‍රතිපාදන රුපියල් මිලියන 13.5ක් වෙන් කරවා ගැනීම සඳහා ධීවර හා ජලජ සම්පත් අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

04. **සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ ලේකම් සහ ශාන්ත ජූඩ් ළමා රෝග පිළිබඳ පර්යේෂණ රෝහල අතර අත්සන් කරනු ලබන ශාන්ත ජූඩ් ගෝලීය සන්ධානයේ වෛද්‍ය ආයතන සාමාජිකත්ව ගිවිසුම**

ශ්‍රී ලංකාව තුළ වසරකට පිළිකා රෝගයෙන් පෙළෙන දරුවන් 600කට වැඩි ප්‍රමාණයක් ජාතික පිළිකා ආයතනයේ ළමා රෝග අංශය විසින් අලුතින් හඳුනා ගනු ලබයි. මෙරට පිළිකා රෝගයෙන් පෙළෙන දරුවන්ගේ සුවවීමේ මට්ටම කලාපීය රටවල්වලට හා ලෝකයේ අනෙකුත් රටවල්වලට වඩා යහපත් මට්ටමක පවතින නමුත් එම තත්ත්වය තවදුරටත් වැඩිදියුණු කරගැනීමට අවස්ථාව පවතින බවට හඳුනාගෙන ඇත. මේ සඳහා ළමා පිළිකාවලට ප්‍රතිකාර කිරීම වෙනුවෙන්ම වූ ගෝලීය වෛද්‍ය ආයතනවල ජාලයක් වන ශාන්ත ජූඩ් ගෝලීය සන්ධානය සමඟ එක්ව කටයුතු කිරීම තුළින් ළමා පිළිකා සත්කාර වැඩිදියුණු කිරීමට හැකියාව පවතින බව හඳුනාගනු ලැබ ඇත. ඒ අනුව, ශාන්ත ජූඩ් ගෝලීය සන්ධානයට සාමාජික ආයතනයක් ලෙස සම්බන්ධ වීම සඳහා අවබෝධතා ගිවිසුමකට එළඹීම පිණිස සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යතුමිය ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

05. අමරදේව අසපුවෙහි ඉදිරි ඉදිකිරීම් කටයුතු

ආචාර්ය පණ්ඩිත් අමරදේව ශූරීන් විසින් සංගීත ක්ෂේත්‍රයට සිදු කරන ලද අනභිභවනීය ජාතික මෙහෙවර කෘතවේදීව අගයනු වස් 'අමරදේව අසපුව' නමින් ලේඛනාගාරයක්, පුස්තකාලයක් හා කෞතුකාගාරයකින් සමන්විත සංගීත ආශ්‍රමයක් බත්තරමුල්ල 'අපේ ගම' පරිශ්‍රයේ පිහිටුවීමට මේ වන විට කටයුතු ආරම්භ කර ඇත. එම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු පවරා තිබූ ආයතනයේ කාර්යසාධනය අපේක්ෂිත මට්ටමක නොපැවතීම හේතුවෙන් අදාළ ගිවිසුම අවලංගු කිරීමට පියවර ගෙන ඇත. අදාළ ඉදිකිරීම් කටයුතු කඩිනමින් නිම කිරීමට හැකිවන පරිදි සුදුසු ආයතනයක් රජයේ විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් තෝරාගැනීම පිණිස තොරතුරු සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

06. විශ්වවිද්‍යාල ප්‍රවේශ හිමිකම් ලබන සිසු දරුවන් හට ලබා දෙන 'මහපොළ ශිෂ්‍යත්ව' මුදල වැඩි කරදීම හා එම ශිෂ්‍යත්ව අවස්ථා ගණන පුළුල් කිරීම

අඩු ආදායම්ලාභී පවුල්වලින් විශ්වවිද්‍යාල අධ්‍යාපන වරම් හිමි වන සිසුන්ට හා විශිෂ්ට ප්‍රතිඵල ලබා ගන්නා සිසුන්ට මාසික මූල්‍ය ආධාරයක් ලබා දීම පිණිස 'මහපොළ ශිෂ්‍යත්ව' වැඩසටහන 1982 වර්ෂයේදී ආරම්භ කර ඇත. එම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන 'මහපොළ ශිෂ්‍යත්ව භාර අරමුදල' විසින් මාසිකව විශ්වවිද්‍යාල වෙත නිදහස් කරනු ලබයි. මේ වන විට විශ්වවිද්‍යාල ප්‍රවේශ හිමිකම් ලබන සිසුන් 30,000ක් අතුරින් 15,000කට පමණ මහපොළ ශිෂ්‍යත්ව ප්‍රදානය කරනු ලබයි. එම ප්‍රමාණය 20,000 දක්වා වැඩි කිරීමටත්, දැනට මාසිකව ගෙවනු ලබන ශිෂ්‍යත්ව ආධාර මුදල වැඩි කිරීමටත් හැකිවන පරිදි අරමුදලේ වත්මන් අරමුදල් ප්‍රමාණය වන රුපියල් බිලියන 10.5ක මුදල 2025 වර්ෂය වන විට රුපියල් බිලියන 20 දක්වා වැඩි කර ගැනීමට හැකිවනු පිණිස හඳුනාගනු ලැබූ උපායමාර්ගික ප්‍රවේශයක් යටතේ විශේෂ වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කිරීම සඳහා උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 07. පොලී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය සඳහා අපේක්ෂිත පරිදි සිසුන් ඇතුළත් නොවීම හා සිසුන් පාඨමාලාව හැරයාම පිළිබඳව වූ වාර්තාව

රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනයක රජයේ පිළිගත් උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා 2017 වර්ෂයේ සිට පොලී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය ආරම්භ කර ඇත. මේ වන විට අදියර 3ක් යටතේ සිසුන් 3,731ක් සඳහා එකී ණය පහසුකම් සලසා දී ඇති අතර ඒ අතුරින් සිසුන් 202ක් විවිධ හේතූන් මත පාඨමාලා හැරගොස් තිබේ. එම වැඩසටහන තවදුරටත් ව්‍යාප්ත කිරීම මඟින් ආර්ථික අපහසුතාවලින් පෙළෙන සිසුන්ට සහනයක් ලබා දීමටත්, ඉදිරියේදී එම වැඩසටහන යටතේ ඉහළ රැකියා උත්පාදනය කරනු ලබන පාඨමාලා සඳහා ප්‍රමුඛතාව ලබා දීමටත් පියවර ගැනීමට අදාළව උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාවට අමාත්‍ය මණ්ඩලය විසින් එකඟතාව පළ කරන ලදී.

## 08. INNOTECH 2020 - තාක්ෂණ හා නවෝත්පාදන ප්‍රදර්ශනය

සමාජයේ සියලු ස්ථරයන්හි විද්‍යා සාක්ෂරතාවය ප්‍රවර්ධනය කිරීමේ සහ උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍යාංශය යටතේ පවතින ආයතන සහ විශ්වවිද්‍යාලයන්හි පර්යේෂණ හා සංවර්ධන අංශයන්හි සොයාගැනීම් ප්‍රදර්ශනය කිරීමේ අරමුණින් එම අමාත්‍යාංශය විසින් 'INNOTECH 2020 - තාක්ෂණ හා නවෝත්පාදන ප්‍රදර්ශනය' නමින් ප්‍රදර්ශනයක් 2020 මාර්තු 11 සිට 15 දක්වා පැවැත්වීමට සැලසුම් කර ඇත. ඒ අනුව, අදාළ පාර්ශ්වකරුවන්ගේ සහයෝගීතාවයෙන් එම ප්‍රදර්ශනය හෝමාගම, පිටිපන ප්‍රදේශයේදී පැවැත්වීම පිණිස උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 09. හෙළ සුවය වස විසෙන් තොර පාරම්පරික වී වගාව

පාරම්පරික වී ප්‍රභේද යොදා ගනිමින් රසායනික පොහොර හා කෘමිනාශක භාවිතයෙන් තොර වී වගා වැඩසටහනක් රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ මැදිහත් වීමෙන් 'හෙළ සුවය' සංවිධානය මඟින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ රාජාංගනය ප්‍රදේශය මූලික කර ගනිමින් ක්‍රියාත්මක වෙමින් පවතී. එම වී මඟින් නිපදවන සහල් සහ එම සහල් ආශ්‍රිතව නිෂ්පාදනය කරනු ලබන ආහාර පරිභෝජනය මඟින් බෝ නොවන රෝගවලින් පීඩා විඳින පුද්ගලයින්ගෙන් බහුතරයක් ඉන් මිදවා ගත හැකි බවට නිරීක්ෂණය කරනු ලැබ ඇත. එම කරුණු සැලකිල්ලට ගෙන නියමු ව්‍යාපෘතියක් වශයෙන් අනුරාධපුර රාජාංගනය ප්‍රදේශයේ

ගොවීන් 2,000ක් අක්කර 10,000ක වපසරියක් තුළ 'හෙළ සුවය' ගොවිතැන සඳහා යොමු කරවීම පිණිස මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

10. **දේශීය බැංකු විසින් අරමුදල් සපයනු ලබන ව්‍යාපෘතිය (LBFP) යටතේ තවදුරටත් ඉතිරිව පවතින ප්‍රතිපාදන භාවිත කරමින් ඉතා ඉක්මනින් වැඩි දියුණු කිරීම සිදු කළ යුතු තෝරා ගත් ජාතික මහා මාර්ග කොටස් වැඩි දියුණු කිරීම**

2011 වසරේ සිට භාණ්ඩාගාර ඇපකර මත දේශීය බැංකු වෙතින් ලබා ගන්නා ලද ණය මුදල් උපයෝජනය කරමින් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් මාර්ග පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරනු ලැබ ඇත. එම ව්‍යාපෘතිය මේ වන විට අදියර 2ක් යටතේ ක්‍රියාත්මක කර ඇති අතර එම අදියර දෙක සඳහා අනුමත කරනු ලැබ ඇති ණය මුදල්වලින් තවදුරටත් රුපියල් මිලියන 1,580ක් පමණ ඉතිරි වනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත. ඒ අනුව, අමාත්‍ය මණ්ඩලය විසින් මේ වන විටත් අනුමත කරනු ලැබ ඇති 'කිලෝමීටර 100,000ක විකල්ප මාර්ග පද්ධතියක් ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන' යටතේ ඉතා ඉක්මණින් වැඩිදියුණු කළ යුතු විකල්ප මාර්ග සංවර්ධනය කිරීම සඳහා එම ඉතිරි අරමුදල් යොදා ගැනීම පිණිස මාර්ග සහ මහාමාර්ග අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

11. **දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්කරගැනීම හේතුවෙන් බලපෑමට ලක් වූ පාර්ශ්වයන් සඳහා ස්වයං ප්‍රතිස්ථාපන දීමනා ගෙවීම**

2016 නොවැම්බර් මස 18 දිනට පෙර දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්කරගැනීම හේතුවෙන් බලපෑමට ලක් වූ ප්‍රාදේශීය සභා බල සීමාවන් තුළ සිය ඉඩම් හිමි පුද්ගලයින්ට ස්වයං ප්‍රතිස්ථාපන දීමනාවක් වශයෙන් රුපියල් 150,000.00ක දීමනාවක් ගෙවනු ලැබ ඇත. එම දීමනාව 2016 නොවැම්බර් මස 18 දිනෙන් පසුව රුපියල් 500,000.00ක් වශයෙන් සංශෝධනය කර ඇත. ඒ හේතුවෙන් මුල් අවස්ථාවේදී ඉඩම් අත්පත් කරගත් අගතියට පත් ඉඩම් හිමියන් 175කට ද අදාළ ස්වයං ප්‍රතිස්ථාපන දීමනාව රුපියල් 500,000.00 දක්වා වැඩි කර ගෙවීම පිණිස මාර්ග සහ මහාමාර්ග අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

12. **ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්වලට අවශ්‍ය සේවාවන් එකම තැනකින් ලබාදීම සඳහා සේවා මධ්‍යස්ථාන (One Stop Shop) පිහිටුවීම**

රටේ දළ දේශීය නිෂ්පාදිතයට 52%ක දායකත්වයක් සපයනු ඇතැයි ඇස්තමේන්තු කර ඇති ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් මඟින් මිලියන 03කට වඩා ජනතාවට ජීවනෝපාය සපයන අතර, එය රටේ සමස්ත රැකියා ප්‍රමාණයෙන් 45%ක් පමණ වේ. ව්‍යාපාරික සේවා ලබා දීම සඳහා පවත්නා ආයතනික ක්‍රමවේදය අනුව එකම කටයුත්ත විවිධ ආයතන මඟින් සිදු කිරීම හා විශාල කාලයක් ගතවීම හේතුවෙන් එම ව්‍යවසායකයන් අපහසුවට පත් වන බව නිරීක්ෂණය වී ඇත. එබැවින්, දිවයිනේ දිස්ත්‍රික්ක 25ම පදනම් කරගනිමින් එක් තැනකින් සේවා සපයන සේවා මධ්‍යස්ථාන 25ක් ආරම්භ කිරීමටත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් අනෙකුත් අදාළ රාජ්‍ය ආයතනවල හා වෙනත් අදාළ පාර්ශවයන්ගේ සහයෝගයෙන් මෙම සේවා මධ්‍යස්ථාන ක්‍රියාත්මක කිරීමටත්, පාලක මණ්ඩලයක් මඟින් එම සේවා මධ්‍යස්ථානවල කළමනාකරණය සිදු කිරීමටත් අදාළව කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

13. **ඔබට රටක් - රටට හෙටක් - සුපිරිසිදු වැඩ බිමක් - වැඩකරන රට දැයක් යන තේමාව යටතේ ශ්‍රමදාන වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම**

'සෞභාග්‍යයේ දැක්ම' ජාතික ප්‍රතිපත්ති ප්‍රකාශයේ දැක්වෙන පරිදි 'ඔබට රටක් - රටට හෙටක්' යන තේමාව ඔස්සේ මහජන හිතෛෂී රාජ්‍ය සේවයක් ඇතිකරලීම පිණිස ඵලදායී සේවා ස්ථානීය පරිසරයක් ගොඩනංවා කාර්යමණ්ඩලය අභිප්‍රේරණය කිරීමේ වැදගත්කම හඳුනාගෙන ඇත. ඒ අනුව, ලංකා ගමනාගමන මණ්ඩලය, දුම්රිය දෙපාර්තමේන්තුව, ලංකා විදුලිබල මණ්ඩලය, ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව මෙන්ම විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය සහ ප්‍රවාහන සේවා කළමනාකරණ අමාත්‍යාංශය යටතේ පවතින අනෙකුත් ආයතනයන්හි සුබසාධක සංගම් හා ඵලදායිතා කණ්ඩායම්වල සහභාගීත්වයෙන් රාජ්‍ය වියදමකින් තොරව 2020 පෙබරවාරි මස 28 වන දින එක් දින ශ්‍රමදාන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමටත්, එම වැඩසටහන ත්‍රෛමාසිකව පැවැත්වීමටත් විදුලිබල හා බලශක්ති අමාත්‍ය සහ ප්‍රවාහන සේවා කළමනාකරණ අමාත්‍යතුමා ඉදිරිපත් කරන ලද යෝජනාව සඳහා අමාත්‍ය මණ්ඩලයේ එකඟතාව ලබා දෙන ලදී.

14. **රජයේ ඉඩම් කළමනාකරණය කිරීමේ කඩිනම් වැඩසටහන**

රජයේ ඉඩම් බදු ගන්නා ගැනුම්කරුවන් අපහසුතාවට පත් නොවන පරිදි අදාළ බදු කුලිය අය කරගැනීම සඳහා සරල සහ පහසු ක්‍රමවේදයක් සකස් කිරීමට අදාළව නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස 2019 දෙසැම්බර් 19 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී කමිටුවක් පත් කිරීමට අනුමැතිය ලබා දෙන ලදී. ඒ අනුව, එකී කමිටුව විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනා ක්‍රියාත්මක කිරීම පිණිස ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා ඉදිරිපත් කරන ලද යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

* බදුකරුවන්ගෙන් අයවිය යුතුව ඇති දඩ පොලිය කපාහැරීම.
* හිඟ බදු ගෙවීම සඳහා බදුකරුවන්ට වර්ෂයක සහන කාලයක් ලබා දීම.
* වාර්ෂික බදු මුදල කාර්තු 04කින් ගෙවීම සඳහා ඔවුන්ට අවස්ථාව ලබා දීම.
* වාර්ෂික බදු මුදල, බදු කාලසීමාවේ මුල් මාසය අවසන්වීමට පෙර ගෙවනු ලබන බදුකරුවන්ට 10%ක වට්ටමක් ලබා දීම.
* තැපැල් කාර්යාල, ණය කාඩ්, ජංගම දුරකථන යෙදුම් වැනි ක්‍රම මඟින් බදු ගෙවීම සඳහා පහසුකම් සලසා දීම.

15. **ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි කර ඇති සංචාරක ආයතන සඳහා සංචාරක සංවර්ධන බදු ගෙවීමේ විලම්භන කාල සීමාව දීර්ඝ කිරීම**

2019 දෙසැම්බර් මස 31 දින දක්වා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි කර ඇති සංචාරක ආයතන විසින් ගෙවිය යුතු සංචාරක සංවර්ධන බදු ගෙවීම සඳහා 2020 ජනවාරි මස 01 දින සිට වසරක සහන කාලයක් ලබා දී ඇත. එහෙත් පාස්කු ඉරුදින ප්‍රහාරයෙන් පසු සංචාරකයින්ගේ පැමිණීම අපේක්ෂිත තරම් ඉහළ ගොස් නොමැති බැවින් අදාළ සහන කාලය තවදුරටත් දීර්ඝ කිරීම සුදුසු බව පෙනී ගොස් තිබේ. ඒ අනුව, සංචාරක සංවර්ධන බද්ද ගෙවීම සඳහා වන සහන කාලසීමාව 2020 අප්‍රේල් 30 දක්වා තවත් මාස හතරකින් දීර්ඝ කිරීමටත්, එම කාලසීමාවට අදාළ නොගෙවන ලද සංචාරක සංවර්ධන බද්ද 2020 මැයි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සමාන වාරික 20කින් අය කරගැනීමටත් සංචාරක සහ ගුවන් සේවා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය අනුමත කරන ලදී.

16. **මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපොළ සහ කොළඹ, රත්මලාන ජාත්‍යන්තර ගුවන්තොටුපොළ වෙත ගුවන් සමාගම් ආකර්ෂණය කර ගැනීම සඳහා වන වැඩසටහන**

මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපොළෙහි අන්තර්ජාතික නිත්‍ය කාලසටහන්ගත ගුවන් ගමන් මෙහෙයුම් නැවත ආරම්භ කිරීම සහ රත්මලාන ජාත්‍යන්තර ගුවන්තොටුපොළෙහි කලාපීය මෙහෙයුම් ආරම්භ කිරීමේ අරමුණින් එම ගුවන්තොටුපොළවල් ප්‍රවර්ධනය කිරීම පිණිස සංචාරක සහ ගුවන් සේවා අමාත්‍යතුමා ඉදිරිපත් කළ පහත යෝජනා සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දෙන ලදී.

**මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපොළ**

* ඇමෙරිකානු ඩොලර් 60ක් වන ගුවන්තොටුපොළ අපගමන බද්ද, මෙම ගුවන්තොටුපොළ තුළ අයකිරීම වසර 02ක කාලයක් සඳහා සම්පූර්ණයෙන් අත්හැරීම.
* මෙම ගුවන්තොටුපොළෙන් පිටවන සංක්‍රමණික සේවකයන් සඳහා වන ගාස්තු සඳහා වට්ටමක් ලබාදීම.
* එම ගුවන්තොටුපොළේ බිම් මෙහෙවර ගාස්තු සඳහා වට්ටම් අනුපාතයක් ලබාදීම.
* සහනදායී මිලකට ගුවන් යානා සඳහා අවශ්‍ය ඉන්ධන සැපයීම.
* ප්‍රවර්ධන දිරිගැන්වීමක් ලෙස වසරක කාලයක් සඳහා උපලේඛනගත ජාත්‍යන්තර ගුවන් සමාගම්වල ගොඩබෑමේ සහ ගුවන් යානා නතර කර තැබීමේ ගාස්තු අත්හැර දැමීම.

**කොළඹ, රත්මලාන ජාත්‍යන්තර ගුවන්තොටුපොළ**

* වසරක කාලසීමාවක් සඳහා ඇමෙරිකානු ඩොලර් 60ක් වන ගුවන්තොටුපොළ අපගමන බද්දෙන් 50%ක් පමණක් අය කිරීම.
* සහනදායී මිලකට ගුවන් යානා සඳහා අවශ්‍ය ඉන්ධන සැපයීම.
* ප්‍රවර්ධන දිරිගැන්වීමක් ලෙස වසරක කාලයක් සඳහා උපලේඛනගත ජාත්‍යන්තර ගුවන් සමාගම්වල ගොඩබෑමේ සහ ගුවන් යානා නතර කර තැබීමේ ගාස්තු අත්හැර දැමීම.

**17. ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වන පළාත් පාලන වැඩි දියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතිය යටතේ ගිරාඳුරුකෝට්ටේ ජල පවිත්‍රාගාරයේ වැඩිදියුණු කිරීම, යාන්ත්‍රික හා විදුලිවැඩ පිළිබඳ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම**

ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍යාධාර යටතේ ක්‍රියාත්මක කරනු ලබන පළාත් පාලන වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතිය යටතේ ඇමෙරිකානු ඩොලර් මිලියන 46.78ක ප්‍රතිපාදන ඌව, උතුරු මැද, මධ්‍යම සහ වයඹ යන පළාත්වල වකුගඩු රෝගයෙන් පීඩාවට පත් ජනතාව වෙසෙන ප්‍රදේශවල ජල සම්පාදන යෝජනා ක්‍රම වැඩිදියුණු කිරීම වෙනුවෙන් වෙන් කරනු ලැබ ඇත. ඒ යටතේ වන ගිරාඳුරුකෝට්ටේ ජල පවිත්‍රාගාරයේ වැඩිදියුණු කිරීම, යාන්ත්‍රික හා විදුලි වැඩ කොන්ත්‍රාත්තුව අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශ පරිදි රුපියල් මිලියන 330.10ක මුදලකට කහතුඩුව පොල්ගස්ඕවිට වාසිරි-සාවින්ද හවුල් ව්‍යාපාරය වෙත පිරිනැමීම පිණිස රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**18. කසළ ප්‍රවාහනය සඳහා බක්කිය සහිත 'කුරුම්බැට්ටියා' බහුකාර්ය පාපැදි ලබාගැනීම**

ජන ගණත්වය ඉහළ යාම සහ වර්තමාන පරිභෝජන රටාව හේතුවෙන් පරිසරයට බැහැර කරන කසළ ප්‍රමාණය ද ඉහළ ගොස් ඇත. කසළ එක්රැස් කිරීම සඳහා කම්පැක්ටර් රථ හෝ ට්‍රැක්ටර් රථවලට පහසුවෙන් ළඟා විය නොහැකි අතුරු මාර්ගයන්හි කැළිකසළ එක්රැස් කිරීම දැනට අත්ට්‍රැක්ටර් මඟින් සිදු කරනු ලබයි. දේශීය නව නිපැයුම්කරුවකු වන සීමාසහිත ජෝෂන් අයි (පුද්ගලික) සමාගම විසින් එවැනි අතුරු මාර්ගයන්ට පහසුවෙන් ප්‍රවේශ විය හැකි පරිසර හානි අවම, කිලෝග්‍රෑම් 250-300 පමණ බරක් රැගෙන යා හැකි බක්කිය සහිත 'කුරුම්බැට්ටියා' නම් පාපැදියක් නිෂ්පාදනය කර තිබේ. මෙම පාපැදි 10ක් මිලදී ගෙන නියමු ව්‍යාපෘතියක් ලෙස පළාත් පාලන ආයතන කිහිපයක් වෙත ලබාදී එහි සාර්ථකත්වය මත අනෙකුත් පළාත් පාලන ආයතන වෙත ද මෙවැනි පාපැදි ලබා දීමට යෝජනා වී ඇත. ඒ අනුව, එම බහුකාර්ය පාපැදි 10ක් එකක් රුපියල් 180,000.00 බැගින් රුපියල් මිලියන 1.8ක මුදලකට මිලදී ගෙන ආගමික ස්ථාන හා පෞරාණික ස්මාරක පිහිටා ඇති පළාත් පාලන ආයතන වෙත ලබා දීම පිණිස රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 19. 'සුරක්ෂා' සිසු රක්ෂණාවරණ වැඩසටහන ඉදිරියටත් පවත්වාගෙන යාම

වයස අවුරුදු 5 සිට අවුරුදු 19 දක්වා වයස් කාණ්ඩයට අයත් සියලුම පාසල් දරුවන් ආවරණය වන අයුරින් දැනට ක්‍රියාත්මක වන 'සුරක්ෂා' රක්ෂණ යෝජනා ක්‍රමය සෞඛ්‍යමත් දරු පරපුරක් බිහි කිරීම හා දරුවන්ගේ අඛණ්ඩ පාසල් යාම තහවුරු කිරීමේ අරමුණින් තවදුරටත් විධිමත් කරමින් ක්‍රියාත්මක කිරීම පිණිස අධ්‍යාපන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 20. කුරුන්චතිවු (අලිමංකඩ - උතුර) ලුණු ලේවාය රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරීත්ව ක්‍රමය යටතේ නැවත ආරම්භ කිරීම

පසුගිය සමයේ පැවති යුදමය ගැටුම් හේතුවෙන් නවතා දැමූ කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පිහිටි කුරුන්චතිවු (අලිමංකඩ - උතුර) ලුණු ලේවායේ නිෂ්පාදන හා මෙහෙයුම් කටයුතු නැවත ආරම්භ කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම පිණිස අමාත්‍ය මණ්ඩලය විසින් මීට පෙර අනුමැතිය ලබා දී ඇති නමුත් මේ දක්වා එම ක්‍රියාවලිය සාර්ථක වී නොමැත. එකී ලුණු ලේවායේ මෙහෙයුම් කටයුතු මාන්තායි සෝල්ට් ලිමිටඩ් ආයතනය සහ විධිමත් ක්‍රමවේදය අනුගමනය කරමින් තෝරාගනු ලබන ආයෝජකයෙක් අතර ක්‍රියාත්මක කරනු ලබන රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්ව ව්‍යාපෘතියක් ලෙස ආරම්භ කර ක්‍රියාත්මක කිරීම සඳහා කර්මාන්ත සහ සැපයුම් කළමනාකරණ අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 21. මහනුවර හා පේරාදෙණිය අතර දුම්රිය මාර්ගය ද්විත්ව මාර්ගයක් බවට පත් කිරීම

දැනට පවතින මහනුවර - පේරාදෙණිය දුම්රිය මාර්ගයට සමගාමීව ඉදිකෙරෙන ද්විත්ව දුම්රිය මාර්ගය ආසන්න වශයෙන් කිලෝමීටර 6.0ක දිගින් යුක්ත වන අතර, මේ වන විට මහනුවර සිට ගැටඹේ දුම්රිය හරස් මාර්ගය දක්වා ඉදි කෙරෙමින් පවතී. ගමන් කාලය තවදුරටත් අඩු කිරීමේ අරමුණින් ගැටඹේ දුම්රිය හරස් මාර්ගය සහ සරසවි උයන අතර දැනට පවතින දුම්රිය මාර්ගයට සමාන්තරව, වැඩිදියුණු කළ සංඥා පද්ධතියක් සහිත අතිරේක මාර්ගයක් ඒකාබද්ධ අරමුදලේ ප්‍රතිපාදන යොදා ගනිමින් ඉදිකිරීම සඳහාත් සැතපුම් 00 දම්වැල් 37 ස්ථානයේ මහවැලි ගඟ හරහා පාලමක් ඉදි කිරීම සඳහාත් ප්‍රවාහන සේවා කළමනාකරණ අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

22. **2020-04-01 සිට 2020-11-30 දක්වා මාස අටක කාලයක් තුළ ඩීසල් (උපරිම සල්පර් ප්‍රතිශතය 0.05) බැරල් 1,137,500ක් සහ ඩීසල් (උපරිම සල්පර් ප්‍රතිශතය 0.001) බැරල් 262,500ක් ආනයනය කිරීම සඳහා දිගුකාලීන කොන්ත්‍රාත්තුවකට එළඹීම**

2020-04-01 සිට 2020-11-30 දක්වා මාස අටක කාලයක් තුළ ඩීසල් (උපරිම සල්පර් ප්‍රතිශතය 0.05) බැරල් 1,137,500ක් සහ ඩීසල් (උපරිම සල්පර් ප්‍රතිශතය 0.001) බැරල් 262,500ක් ආනයනය කිරීම සඳහා වන කොන්ත්‍රාත්තුව අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද විශේෂ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශ පරිදි M/s Petrochina International Pte. Ltd., Singapore වෙත පිරිනැමීම පිණිස විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය අනුමත කරන ලදී.

23. **ලොකු ළූණු සඳහා වන රජයේ අවම සහතික මිල ඉහළ නැංවීම මගින් ලොකු ළූණු ගොවියන්ගේ ආදායම ඉහළ නැංවීම**

'රට හදන සෞභාග්‍යයේ දැක්ම' ප්‍රතිපත්ති ප්‍රකාශය මගින් ලොකු ළූණු වැනි භෝග නිෂ්පාදනය සඳහා නව වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමටත්, එම භෝග ආනයනය සඳහා වැය වන අධික විදේශ විනිමය භෝග වගා කරන ගොවීන්ගේ ආදායමක් බවට පත් කිරීමටත් යෝජනා කර ඇත.

ගොවීන්ට තම අස්වැන්න සඳහා සාධාරණ මිලක් ලබා දෙමින් වගාව සඳහා ඔවුන් දිරිමත් කිරීම පිණිස ලොකු ළූණුවල රජයේ සහතික මිල ඉහළ නැංවීම සිදු කළ යුතු බවට සහ එම වගාව සඳහා ඉඩම් උපරිම ඵලදායීතාවකින් යුතුව යොදා ගැනීම පිණිස සුදුසු වැඩපිළිවෙළක් සැකසීම අත්‍යවශ්‍ය බවට හඳුනාගෙන ඇත. ඒ අනුව, ලොකු ළූණු කිලෝවක් සඳහා දැනට ලබා දෙන රුපියල් 60/- ක් වූ අවම සහතික මිල රුපියල් 80/- දක්වා ඉහළ නැංවීමටත්, ලොකු ළූණු වගාවන්හි ඵලදායිතාව ඉහළ නැංවීම මගින් නිෂ්පාදනය ඉහළ දැමීම සඳහා මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය මගින් විශේෂ වැඩ සටහනක් කඩිනමින් ක්‍රියාත්මක කිරීමටත්, මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු අග්‍රාමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය අනුමත කරන ලදී.

24. **සහස්‍ර අභියෝගතා සංස්ථාව (MCC) සංයුක්ත සංවර්ධන ගිවිසුම සමාලෝචනය කිරීම සඳහා පත් කළ කමිටුවේ අතුරු වාර්තාව**

2019 දෙසැම්බර් මස 18 දින අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණයක් පරිදි සහස්‍ර අභියෝගතා සංස්ථා ව්‍යාපෘතිය සම්බන්ධයෙන් අධ්‍යයනය කර ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව රජයට නිර්දේශ ලබා දීම පිණිස මහාචාර්ය ලලිතසිරි ගුණරුවන් මහතාගේ සභාපතිත්වයෙන් යුතුව සමාලෝචන කමිටුවක් පත් කර ඇත. එම කමිටුව විසින්, ගරු අග්‍රාමාත්‍යතුමා වෙත අතුරු වාර්තාවක් ඉදිරිපත් කර ඇති අතර ප්‍රාග්ධන සම්පත් හිඟ සහ ණය බරින් පෙළෙන ශ්‍රී ලංකාවේ මූලික ආර්ථික සංරෝධක දුරලීමේ ආයෝජන උදෙසා අවශ්‍ය මූල්‍ය සම්පත් රටේ විදේශ ණය බර වැඩි නොකරමින් සපයා ගැනීමේ හැකියාව MCC යෝජනාව තුළ ඇතුළත්ව ඇතත් එම වැඩසටහන යටතේ යෝජිත ඇතැම් ව්‍යාපෘතීන් තුළ ශ්‍රී ලංකාවේ ජාතික, සමාජ හා ආර්ථික සුභ සිද්ධියට අගතිකාරී බලපෑම් එල්ල විය හැකි යම් අංග ඇතුළත්ව ඇති බව එකී වාර්තාවේ පෙන්වා දී ඇත. එසේම යෝජිත සංයුක්ත ගිවිසුමෙහි සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ගිවිසුමෙහි මෙන්ම ස්ථාපනය කිරීමට යෝජිත සමාගමේ සාංගමික ව්‍යවස්ථා කෙටුම්පතෙහි ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට හා රටේ නීති පද්ධතියට අනුකූල නොවීමට ඉඩ ඇති වගන්ති හා ප්‍රතිපාදන මෙන්ම ජාතික අරමුණුවලට, ස්වෛරීත්වයට හා ජාතික ආරක්ෂාවට අගතිකාරී ලෙස බලපෑ හැකි වෙනත් කොන්දේසි ද ඇතුළත් වී ඇති බව ද වැඩි දුරටත් පෙන්වා දී ඇත. එබැවින් එවැනි අයහපත් අංග සඳහා සුදුසු නිවැරදි කිරීම් හා සුදුසු සංශෝධනයන් සිදු කිරීම අත්‍යවශ්‍ය බවත් ඉන් අනතුරුව අදාළ කොන්දේසි හා ව්‍යාපෘති යෝජනා පිළිබඳව මහජන අදහස් ලබාගැනීමේ අවශ්‍යතාව සහ පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබාගැනීම සුදුසු බවත් කමිටුව විසින් පෙන්වා දී ඇත. එම කරුණු ඇතුළත් කමිටුවේ අතුරු වාර්තාව අමාත්‍ය මණ්ඩලයේ දැන ගැනීම පිණිස ගරු අග්‍රාමාත්‍යතුමා විසින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදුව අමාත්‍ය මණ්ඩලය විසින් එහි සඳහන් කරුණු, මූලික නිගමන සහ නිර්දේශ සැලකිල්ලට ගන්නා ලදී.

25. **දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ක්‍රියාත්මකව පවතින ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතියේ RAMIS 2.0 - B කොටසේ මෘදුකාංගය වෙනස් කිරීම සඳහා වන කොන්ත්‍රාත්තුව පිරිනැමීම**

බදු පරිපාලන ක්‍රියාවලියේ මූලික කාර්යයන් ඉටු කිරීමට 2016 වර්ෂයේ සිට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් RAMIS වැඩසටහන භාවිත කරන අතර එමගින් රාජ්‍ය බැංකු සහ වෙනත් ආයතනවලට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමග අන්තර්ජාල සේවා හරහා සම්බන්ධ

වීමේ සහ අතුරු මුහුණත් සැපයීමේ ඉඩ ප්‍රස්ථාව සලසයි. නව දේශීය ආදායම් පනත කඩිනමින් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව සැලකිල්ලට ගෙන RAMIS 2.0 - B ලෙස සංස්කරණය කළ RAMIS 2.0 මෘදුකාංගයේ ඉතිරි කොටස වෙනස් කිරීම සඳහා වන කොන්ත්‍රාත්තුව, අමාත්‍ය මණ්ඩලය විසින් පත් කළ සාකච්ඡා සම්මුති කමිටුවේ නිර්දේශය පරිදි, සිංගප්පූරු ඩොලර් 15,534,364ක පිරිවැයකට Singapore Cooperation Enterprise (SCE) ආයතනය වෙත ප්‍රදානය කිරීමට මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු අග්‍රාමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය අනුමත කරන ලදී.

26. **නව කොරෝනා වෛරසය (COVID - 19) ව්‍යාප්තිය තුළ යුරෝපය, මැදපෙරදිග සහ නැගෙනහිර ආසියා කලාපයන්හි වෙසෙන ශ්‍රී ලාංකිකයන්ගේ ආරක්ෂාව සහ සුභ සාධනය සැලසීම පිණිස ශ්‍රී ලංකා දූත මණ්ඩල විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග**

මේ වන විට පුද්ගලයින් 2,700කට වැඩි ප්‍රමාණයකට ජීවිත අහිමි කරමින් හා පුද්ගලයින් 80,000කට වැඩි ප්‍රමාණයක් ආසාදනයට ලක් කරමින් නව කොරෝනා වසංගතය රටවල් 44ක් පුරා ව්‍යාප්ත වී ඇත. එම රටවල්වල වෙසෙන ශ්‍රී ලාංකිකයන් කිසිවෙකුහට එම වෛරසය ආසාදනය වී ඇති බවට වාර්තා වී නොමැති බවත්, එම රටවල්වල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල විසින් ඔවුන්ගේ ආරක්ෂාව හා සුභසාධනය පිණිස ගෙන ඇති ක්‍රියාමාර්ගයන් සම්බන්ධයෙනුත් වැඩබලන විදේශ සබඳතා ඇමතිතුමා විසින් අමාත්‍ය මණ්ඩලය දැනුම්වත් කරන ලදී. එමෙන්ම ඉදිරියට උද්ගත විය හැකි තත්ත්වයන් සම්බන්ධයෙන් නොපමාව අවශ්‍ය පියවර ගැනීමට හැකි වන පරිදි විදේශ සබඳතා අමාත්‍යාංශය විසින් එම කටයුතු පිළිබඳව සමීප අධීක්ෂණයක් අඛණ්ඩව පවත්වාගෙන යනු ලබන බවට ද අමාත්‍යතුමා වැඩිදුරටත් ඉදිරිපත් කරන ලද තොරතුරු අමාත්‍ය මණ්ඩලය විසින් සැලකිල්ලට ගන්නා ලදී.

27. **ගුරු - විදුහල්පති සේවාවන්හි වැටුප් විෂමතාවයන් ඉවත් කිරීම**

දීර්ඝ කාලයක් පුරා පවතින ගුරුවරුන් විදුහල්පතිවරුන් හා අධ්‍යාපන ක්ෂේත්‍රයට සම්බන්ධ සියලු වෘත්තිකයන්ගේ වැටුප් හා සේවා තත්ත්වයන් පිළිබඳ ගැටලු සැලකිල්ලට ගෙන, ශ්‍රී ලංකා ගුරු සේවය ප්‍රමුඛ අදාළ සියලු සේවාවන් ඒකාබද්ධ කොට වැටුප් හා සේවා ව්‍යවස්ථාවක් සකස් කොට සුදුසු වැටුප් ක්‍රමයක් සකස් කිරීමේ අවශ්‍යතාව 'සෞභාග්‍යයේ දැක්ම' ප්‍රතිපත්ති ප්‍රකාශයේ පෙන්වා දී ඇත. ඒ අනුව කටයුතු කිරීම පිණිස මේ වන විටත් අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තිමය වශයෙන් තීරණයකට එළඹී ඇති නමුත්, මේ වන විට ගුරු - විදුහල්පති සේවාවන්හි පවතින වැටුප් විෂමතාව හේතුවෙන් පැන නැගී

ඇති තත්ත්වය පිළිබඳව අධ්‍යාපන ඇමතිතුමා විසින් අමාත්‍ය මණ්ඩලය වෙත දීර්ඝ වශයෙන් කරුණු ඉදිරිපත් කරන ලදී.

රාජ්‍ය අංශයේ වැටුප් සම්බන්ධයෙන් අධ්‍යයනය කර පවතින විෂමතා ඉවත් කිරීමට හැකි වන පරිදි නව වැටුප් ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා අතිගරු ජනාධිපතිතුමා විසින් මෑතකදී ජාතික වැටුප් කොමිෂන් සභාවක් ස්ථාපිත කර ඇති අතර, එකී කොමිෂන් සභාවේ නිර්දේශ ඉදිරියේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට නියමිත අයවැය මගින් ක්‍රියාත්මක කිරීමට රජය අපේක්ෂා කරනු ලබයි. ඒ අනුව එකී කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරනු ලබන නිර්දේශ මගින් ගුරු - විදුහල්පති සේවාවන්හි දැනට පවතින වැටුප් විෂමතාවන් ද ඉවත් කිරීමට පියවර ගත යුතු බවට අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරන ලදී.

*************